# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි තෙවන වසර (පුනර්) පරීක්ෂණය - 2018/2019
## නර්තන හා නාට්‍ය කලා පීඨය
## <u>අවස්ථා කළමනාකරණය – DIAD 31112</u>

කාලය :- පැ 02

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත ය.
❖ <u>ප්‍රශ්න හතරකට (04) පමණක්</u> පිළිතුරු සපයන්න.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

1. අ. අයවැය ලේඛනය යනු කුමක්දැයි හඳුන්වා එය පිළියෙල කිරීමේ අරමුණු සැකවින් දක්වන්න.
(ලකුණු 03)

   ආ. ඔබ ඉගෙනුම ලැබූ පාසලේ වාර්ෂිකව පැවැත්වෙන නර්තන ප්‍රසංගයේ අවස්ථා කළමනාකරණයට අදළ සියලු කටයුතු සිදු කිරීම සඳහා එහි විදුහල්පතිවරයා විසින් ඔබට පවරා ඇත. මේ සඳහා ප්‍රතිපාදන වශයෙන් රු. 1,000,000.00 ක මුදලක් වෙන් කර ඇත්නම් එම මුදල යොදවා වැය දැරීම් සිදුකෙරෙන ආකාරය දැක්වෙන වියදම් ඇස්තමේන්තුවක් නිවැරදි ආකෘතියේ පිළියෙල කරන්න.
(ලකුණු 12)

2. "පාරිභෝගික අවශ්‍යතා මැනවින් හඳුනාගනිමින් ඒවා බලාපොරොත්තු වූවාට වඩා යහපත් අන්දමින් ඉටු කර දීම අවස්ථා කළමනාකරුවාගේ ප්‍රමුඛ කාර්යභාරයයි." මෙම ප්‍රකාශය ඇසුරෙන් අවස්ථා කළමනාකරුවාගේ කාර්යභාරය පිළිබඳ විමසීමක් කරන්න.
(ලකුණු 15)

3. නූතන ආර්ථික පරිසරයට ගැළපෙන පරිදි අවස්ථා සංකල්ප නිර්මාණය කිරීමට සහ ක්‍රියාවට නැංවීම සඳහා අවස්ථා කළමනාකරුවකු තුළ තිබිය යුතු බහුවිධ කුසලතාවන් පිළිබඳ විමසීමක් කරන්න.
(ලකුණු 15)

4. අවස්ථාවක් සාර්ථක කරගැනීම සඳහා තාක්‍ෂණය යොදාගත හැකි ආකාරය කරුණු 04 ක් ඔස්සේ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 15)

5. අවස්ථා කළමනාකරණයේ දී පැන නගින ගැටලු 04 ක් දක්වා, ඒවා මගහරවා ගැනීම සඳහා ඔබට දිය හැකි විසඳුම් කවරේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 15)

6. අවස්ථා කළමනාකරණයේ දී අලෙවිකරණයයේ වැදගත්කම නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 15)

………………….                                   2022.05. …